* සියලු ම හිමිකම් ඇවිරිණි

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2023 ජනවාරි

## (204) ව්‍යාපාර කළමනාකරණය

(Business Management)

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අධානයෙන් කියවිය යුතුය):

(1) **දී ඇති කාලය** : කියවීම සඳහා විනාඩි 15
: උත්තර ලිවීම සඳහා පැය 03

(2) **සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.**

(3) ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන් එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.

(4) උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.

(5) අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණේ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයකම් කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.

(6) ලකුණු 100.

---

### A කොටස

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

**අංක 1.1 සිට 1.5 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරා ගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.**

1.1 7Ms නිවැරදිව සඳහන් කර ඇති ප්‍රකාශය තෝරන්න?

a) Men, Money, Machines, Materials, Methods, Minutes, Market
b) Men, Money, Machines, Materials, Methods, Minutes, Motivation
c) Men, Money, Machines, Materials, MIS, Minutes, Market
d) Men, Money, Machines, Materials, Methods, MIS, Motivation

1.2 හොඳ තොරතුරක ගුණාංගයක් නොවන්නේ මින් කුමක්ද?

a) පිරිවැය ඵලදායි බව
b) තේරුම්ගත හැකි බව
c) අදාල බව
d) භාවිතයට ගැනීමට පෙර සැකසිය යුතු වීම

JMC vLearning
"your virtual learning partner"

1.3 අධිකාරිත්වය සම්බන්ධයෙන් නිවැරදි නොවන ප්‍රකාශය පහත සඳහන් ප්‍රකාශ තුළින් තොරන්න?

a) අධිකාරිත්වය යනු තීරණ ගැනීමට ඇති බලයයි
b) ඔහුගේ තනතුරේ විෂයපථය ඇතුලත තම ප්‍රධානීන්ට අණදීමට ඇති අයිතිය මින් අදහස් කෙරේ
c) අණදීමට හා ක්‍රියා කිරීමට ඇති නීත්‍යානුකූල බලය වශයෙන්ද එය හැඳින්විය හැක
d) කළමනාකරුවන් විසින් ඔවුන්ගේ වගකීම තම සහයකයින් පවරන විට ඔවුන්ට අධිකාරී බලය ද පැවරිය යුතුය

1.4 සඵලදායී සන්නිවේදනයක ප්‍රතිලාභයක් නොවන්නේ කුමක් ද?

a) සඵලදායී ගැටළු නිරාකරණය කිරීමට හැකි වීම
b) සේවක අභිප්‍රේරණය තුලින් ඵලදායීතාව ඉහල දැමීමට හැකිවීම
c) සංවිධානයේ විනිවිද භාවය" විශ්වාසය" පැහැදීම පහල දැමීමට හැකිවීම
d) සමාගමේ ක්‍රියාකාරීත්වය සුමටව පවත්වා ගැනිමට හැකිවීම

1.5 පොටර්ගේ වටිනාකම් දාමයේ ප්‍රාථමික ක්‍රියාත්මක වන්නේ මින් කුමක්ද?

a) ප්‍රතිසම්පාදනය
b) තාක්ෂණය
c) මානව සම්පත් කළමනාකරණය
d) මෙහෙයුම්

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

**ප්‍රශ්න වල හිස්තැන් පිරවීම සඳහා වරහන් තුළ ඇති උත්තර දෙක අතුරෙන් නිවැරදි උත්තරය තෝරාගන්න**

1.6 ඉදිරි ඒකාබද්ධවීම, පසු ඒකාබද්ධ වීම සහ තිරස් ඒකාබද්ධ වීම යනුවෙන්…………………..……… (ඒකාබද්ධ උපායමාර්ග / විස්තීර්ණ උපායමාර්ගය) තවදුරටත් වර්ග කළ හැකිය.

1.7 සාමාන්‍යයෙන් ගත්කළ ආංශික ව්‍යුහය විවිධ නිශ්පාදිත වර්ග අනුව නිර්මාණය වන නමුත් ඇතැම් ව්‍යාපාර ……………………………………………… (විවිධ පාරිභෝගික කණ්ඩායම් / ක්‍රියාකාරකම්) අනුව වෙන් වූ අංශ හඳුනා ගනී.

1.8 ඔහියෝ ප්‍රාන්ත විශ්ව විද්‍යාලය නායකයින්ගේ මූලික ශෛලීන් දෙකක් හඳුනාගෙන ඇත කාර්යයට නැඹුරු නායකයින් ……………………………… (කාර්ය අභිමුඛ නායකයින් / පුද්ගල නැඹුරු නායකයින්).

1.9 වෙනසෙහි බලවේග ප්‍රධාන වශයෙන් මූලාශ්‍ර 2 ක් න් පැන නගී එනම් බාහිර බලවේග සහ…………………………………… (අභ්‍යන්තර බලවෙග / සමාජීය බලවෙග).

1.10 ශදුඅත විශ්ලේෂණය ව්‍යාපාර පරිසරයේ ශක්තීන්" දුර්වලතා" අවස්ථා සහ …………………… (තර්ජන / පරමාර්ථ) විශ්ලේෂණය කිරීමේ ශිල්ප ක්‍රමය මින් අදහස් වේ.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 05)

JMC vLearning
“your virtual learning partner”

**අංක 1.11 සිට 1.15 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.**

1.11 සංවිධානවල දිගුකාලීන අරමුණු ලඟා කර ගැනීම පිණිස එහි උපායමාර්ගික කළමනාකරුවන් විසින් අනුගමනය කරන විවිධ උපායමාර්ග වර්ග දෙකක් සඳහන් කරන්න?

1.12 පීටර් ඩ්‍රකර්ට අනුව කාරයක්ෂමතාවය යනු?

1.13 ජපන් කළමනාකරණ තාක්‍ෂණ ක්‍රමවේදයන්හි ප්‍රධාන ක්‍රියාකාරකම් දෙකක් සඳහන් කරන්න?

1.14 අලෙවිකරණ මිශ්‍රය සඳහන් කරන්න?

1.15 ඉල්ලුම පුරෝකථනය කිරීමේ වැදගත්කම දෙකක් සඳහන් කරන්න?

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)

A කොටසේ අවසානය

**B කොටස**

(මුළු ලකුණු 50)

## 02 වන ප්‍රශ්නය

කළමනාකරණය යනු සංවිධානයක අරමුණු කාර්යක්ෂමව හා සඵලදායීව ලගාකර ගැනිම උදෙසා සංවිධානයක සම්පත් (මානව, මූල්‍ය, භෞතික හා තොරතුරු) නිසි ආකාරව භාවිතය සඳහා ගොඩනගා ගත් ක්‍රියාකාරකම් (සැලසුම්කරණය හා තීරණ ගැනීම, සංවිධානකරණය, මෙහෙයවීම සහ පාලනය ඇතුලත්ව) සමූහයක එකතුවකි.

a) කළමනාකරණ කාර්යයන් සඳහන් කර කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 04)
b) කළමනාකරුවකු යනු කවුරුන් දැයි පැහැදිලි කරන්න (ලකුණු 02)
c) මින්ට්ස්බර්ග්ට අනුව කළමනාකරුවකුගේ කාර්යභාරයන් හතරක් ගෙන කෙටියෙන් පැහැදිලි කරන්න (ලකුණු 04)

## 03 වන ප්‍රශ්නය

මෙහෙයුම් යනු ව්‍යාපාරයක යෙදවුම් නිමවුමක් බවට පරිවර්තනය කිරීම හා සම්බන්ධව සලකා බලන ප්‍රධාන ශ්‍රිතයකි එබැවින් මෙහෙයුම් ව්‍යාපාරයේ හදවත ලෙස හැදින්වේ නිෂ්පාදනයට වඩා මෙහෙයුම් කළමනාකරණය වෙනස් වේ නිෂ්පාදනය යනු නිෂ්පාදන පහසුකම් හරහා අමුද්‍රව්‍ය සැකසීම තුලින් නිමි භාණ්ඩ නිර්මාණය කිරීමයි මෙහෙයුම් කළමනාකරණය පුළුල් විශයපථයක් ඇති අතර නිෂ්පාදනය එහි උප විෂයක් වේ.

a) නිෂ්පාදන ක්‍රම හතරක් සඳහන් කරන්න (ලකුණු 02)
b) සමස්තථ තත්ව කළමනාකරණය (Total Quality Management) යනු කුමක්ද යන්න පැහැදිලි කර එහි පවතින වාසි කීපයක් ගෙනහැර දක්වන්න (ලකුණු 03)
c) සේවා කලමනාළමණාකරණයේ දුෂ්කරතා තුනක් ගෙන ඒවා පැහැදිලි කරන්න (ලකුණු 05)

JMC VLearning "your virtual learning partner"

## 04 වන ප්‍රශ්නය

සෑම ව්‍යාපාරයකටම තම ව්‍යාපාර කටයුතුවලට අත්‍යාවශ්‍ය අංගයක් ලෙස අලෙවිකරණ ක්‍රියාකාරකම් වැදගත් වේවි සරලව අලෙවිකරණය යනු ගනුදෙනුකරුවන් ආකර්ශනය කරගැනීම සහ රඳවා ගැනීමය එනම් යම් ව්‍යාපාරයට වෙළෙඳපොළ තුළ සාර්ථකව පැවතීමට නම් නිරන්තරයෙන් ගනුදෙනුකරුවන් ආකර්ෂණය කරගත යුතු අතර ආකර්ෂණය කරගත් ගනුදෙනුකරුවන් දීර්ඝකාලීන රඳවා තබා ගැනීම සිදු කළ යුතුය.

a) වෙළඳපල වර්ධනය සහ වෙළඳපල පෝෂණය හඳුන්වන්න (ලකුණු 02)

b) අලෙවිකරණය වැදගත් වීමට බලපාන කාරණා තුනක් ගෙන් එය පැහැදිලි කරන්න (ලකුණු 03)

c) ඩිජිටල් අලෙවිකරණ ක්‍රම තුනක් ගෙන එය උදාහරණ සහිතව පැහැදිලි කරන්න (ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

සංවිධානයක වැදගත්ම සම්පත වන්නේ මානව සම්පතයි. භෞතික මුල්‍ය සහ තාක්ෂණික සම්පත්වලට වඩා මානව සම්පත සංවිධානයේ අරමුණු සාධනයට සෘජු දායකත්වයක් ලබා දේ මුල් කාලයේදී ආයතනයේ වටිනාම සම්පත ලෙස සැලකුවේ ගණුදෙනුකරුවන්ය. නමුත් වර්තමානයේදී ගණුදෙනුකරුවන් තරමටම සේවකයින්ද ආයතනයේවටිනාම සම්පත ලෙස සලකනු ලබයි. මන්ද යත් මනා දක්ෂතාවයකින් හා කුසලතාවයකින් පිරිපුන් සේවක පිරිසක් නොමැතිනම් ආයතනයට තම අරමුණු හා පමාර්ථ කරා යාම සිහිනයක් වන බැවිනි.

a) අනෙකුත් සම්පත් වලට සාපේක්ෂව මානව සම්පතෙහි දක්නට ඇති විශේෂ ලක්ෂණ සඳහන් කරන්න (ලකුණු 03)

b) රැකියා විස්තරය සහ රැකියා පිරිවිතරය වෙනස් වෙන ආකාරය පැහැදිලි කරන්න (ලකුණු 03)

c) අභ්‍යන්තර ආකර්ශනයේ සහ බාහිර ආකර්ශනයේ වාසි අවාසි සඳහන් කරන්න (ලකුණු 04)

## 06 වන ප්‍රශ්නය

උපායමාර්ගික කළමනාකරණය යනු තරඟකාරී වාසියක් නිර්මාණය කිරීම සහ පවත්වා ගැනීම සඳහා, සාමාන්‍යයෙන් එහි අයිතිකරුවන් වෙනුවෙන් සංවිධානයක නායකයින් විසින් ගනු ලබන ප්‍රධාන අරමුණු සහ මුලපිරීම් සකස් කර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියයි. සංවිධානයේ අභ්‍යන්තර හා බාහිර පරිසරය විශ්ලේෂණය කිරීම,දිගුකාලීන ඉලක්ක තැබීම, එම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උපාය මාර්ග සැකසීම සහ උපාය මාර්ග ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සම්පත් වෙන් කිරීම ඊට ඇතුළත් වේ.

a) ඒකාබද්ධ උපායමාර්ග යනු කුමක්දැයි සඳහන් කරන්න (ලකුණු 04)

b) ආරක්ෂණ උපායමාර්ගය යනු කුමක්දැයි සඳහන් කරන්න (ලකුණු 04)

c) හොඳඋපායමාර්ගවල ලක්‍ෂණ හතරක් සඳහන් කරන්න (ලකුණු 02)

B කොටසේ අවසානය

JMC vLearning your virtual learning partner

## C කොටස
(මුළු ලකුණු 25)

නිමල් යනු තම පාසල් අධ්‍යාපනය උසස් පෙළින් අවසන් කළ තම දම දහඩිය මහන්සියෙන් තමාගේම ව්‍යාපාරයක් පටන් ගත් තරුණයෙකි' සිල්ලර වෙළඳසැලක් ලෙස ආරම්භ කල තම ව්‍යාපාරය වසර කීපයක් යනවිට  වසරින් වසර දියුණුව කරා රැගෙන යාමට නිමල්ගේ දහඩිය මහා මහන්සිය  නිසා හැකි විය.
සිල්ලර වෙළඳසැල් මේ වන විට  සුපිරි වෙළඳසැලක් මට්ටමට පත්ව ඇත. මහල් කිහිපයකින්න් සමන්විත ඔහුගේ වෙළඳසැල්  තුළින් නිවසට අවශ්‍යය ඕනෑම භාණ්ඩයක් ලබාගත් හැක. වසර ගණනක් ව්‍යාපාරය කිරීම තුළින් පාරිභෝගිකයන් අතර ඇතිවී තිබෙන විශ්වාසයත්  ඔහුගේ භාණ්ඩ වල තිබෙන ගුණාත්මභාවයත්  සාධාරණ මිලට භාණ්ඩ ලබා දීමක් නිසා ඔහුගේ ව්‍යාපාරය නගරය තුළ ජනප්‍රියතම ව්‍යාපාරයක් බවට මේ වන විට පත්ව ඇත.

මෙවන විට ඔහුගේ ව්‍යාපාරය තුළ  සේවකයින  සියයකට අධික ප්‍රමාණයක් සේවය කරන අතර නගරය තුළ පවතින ප්‍රධාන පෙළේ වෙළෙඳසැලක් බවට පත්ව ඇත. එනමුදු මේ වන විට ව්‍යාපාර ලෝකය තුල පවතින තරගය සමග ඔහුගේ ව්‍යාපාරයට දැවැන්ත අපි අභියෝගයක් එල්ල වෙමින් පවතී.P දිනෙන් දින ඉහළ යන තරගකාරීත්වයත්  තාක්ෂණයක් නිසා  ඔහුගේ ව්‍යාපාරය දැවැන්ත අභියෝගයකට මුහුණ පාමින් සිටී. ඔහු සතුව සිටින සේවක මණ්ඩලය දක්ෂතා  අල්පවීමත්  හැකියාවන් දැන් පවතින වෙළඳපොල මුහුණදීමට තරම් දියුණු නොවීමත් ඔහුට මුහුණ දීමට සිදුව තිබෙන තවත් අභියෝගයකි මෙම නිසා ඔහු දක්ෂ කළමණාකරුවෙකු තව සමාගමට බඳවා ගැනීමට තීරණය කරයි එම කළමනාකරුවා ඔබෙයයි සිතා පහත  සඳහන්ය ගැටළු සඳහා ඔබ ලබාදෙන පිළිතුරු සපයන්න.

a) ඉහත ව්‍යාපාරයේ ශක්තීන්, දුර්වලතා, අවස්ථා තර්ජන හඳුනාගැනීම සඳහා ශ දු අ ත විශ්ලේෂණයක් සිදුකරන්න (ලකුණු 04)
b) අප ඉහත සඳහන් ගැටලුවලට පිළිතුරක් වශයෙන් සංවිධානයය ප්‍රතිව්‍යුහගතකරණය කළයුතුයැයි සිතා  එහි දැකිය හැකි වාසි සහ අවාසි සඳහන් කරන්න (ලකුණු 06)
c) කළමනාකරුවකුට පැවැතිය යුතු සන්නිවේදන නිපුනණතා සඳහන් කර ඒවා පැහැදිලි කරන්න. (ලකුණු 06)
d) නායකයකුගේ කාර්යභාරයන් දෙකක් සඳහන් කර ඒවා පැහැදිලි කරන්න (ලකුණු 04)
e) පාලනයේ වැදගත්කම සඳහන් කරන්න (ලකුණු 05)

C කොටසේ අවසානය

JMC vLearning
"your virtual learning partner"